# වැලිගම ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 24 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 19 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට වැලිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

(අ) 2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල රු.369,169 ක් වූ ප්‍රාග්ධන වියදම් පුනරාවර්තන වියදම් ලෙස වර්ෂයේ ආදායමට එරෙහිව කපාහැර තිබුණි.

(ආ) සියයට 10 රඳවුම් මුදල් ගිණුමේ වූ රු.2,359,365 ක් වූ හර ශේෂය බැරකම් වලින් අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වසර වෙනුවෙන් වීථි පහන් ප්‍රතිපූර්ණය වශයෙන් සභාවට ලැබිය යුතු රු.63,310 ක වටිනාකම වෙනුවෙන් ණයගැති ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී පරිත්‍යාග ලෙස මුදලින් නොලද පුස්තකාල පොත්වල හා ජෙනරේටර් යන්ත්‍රයේ වටිනාකම වූ රු.115,813 ක් වත්කම් ගිණුම හර කර ප්‍රාග්ධන යෙදුමට ආදයමින් දායක වීමේ ගිණුමට බැර කර තිබූ අතර එකී වටිනාකම මුදල් ලැබීමක් මෙන්ම ගෙවීමක් ලෙසද ගිණුම් තබා තිබුණි.

1.3.3 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 04 කට අදාල ශේෂයන්ගේ වටිනාකම රු.7,742,478 ක් වූ අතර උපයෝගි ලේඛන අනුව එම ගිණුම් ශේෂයන්ගේ වටිනාකම රු.3,491,884 ක් වූයෙන් රු.4,250,594 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.4 අවිනිශ්චිත ගිණුම

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අවිනිශ්චිත ගිණුමේ රු.65,791 ක් වූ බැර ශේෂය නිරවුල් කර නොතිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන 123,652,765 ක් වටිනා වත්කම් ශේෂ 4 ක් හා රු.27,649,776 ක් වටිනා වගකීම් ශේෂයක් සම්බන්ධව සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

1.3.6 නීති, රීති , රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| රීති 217-218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි වාර්ෂිකව සමීක්ෂණය කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති 2002/02 දරන භාණ්ඩාගාර ලේකම්ගේ චක්‍රලේඛය | පරිසනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.20,051,774 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.50,909,519 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් බදු | 7,421 | 998 | 749 |
| බදු කුලී | 5,144 | 193 | 139 |
| බලපත්‍ර ගාස්තු | 2,637 | 1,705 | 92 |

2.2.2 වරිපනම් බදු

2013 ජනවාරි 01 දිනට හිඟ හිටි වරිපනම් බදු මුදල රු.1,060,880 ක්ද වර්ෂයේ බිල්කිරීම් මුදල රු.270,433 ක් ද සමඟ ලැබිය යුතු මුදලේ එකතුව රු.1,331,313 ක් විය. මෙකී මුදලින් සමාලෝචිත වර්ෂයේ අයවූ මුදල රු.277,221 ක් වූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 20 ක් තරම් සුළු අගයක් ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් 1987 අංක 105 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(ආ) වගන්තිය අනුව ආදායම් අයකිරීමේ බලධාරියා වන සභාවේ ලේකම්වරයාගේ අවධානය යොමුවී නොතිබුණි.

2.2.3 බදු කුලී

2013 ජනවාරි 01 දිනට හිඟ හිටි කුලී මුදල රු.30,645 ක්ද වර්ෂයේ බිල්කිරීම් රු.301,800 ක්ද සමඟ ලැබිය යුතු මුදල් එකතුව රු.332,445 ක් විය. මෙකී මුදලින් වර්ෂය තුල අයකර ගෙන තිබුනේ රු.11,270 ක් වූ අතර අයවීමේ ප්‍රතිශතය සියයට 3 ක තරම් සුළු අගයක් ගෙන තිබුණි.

2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ රු.2210,961 ක උසාවි දඩ මුදල් පහත දැක්වේ.

2.2.5 වැලිගම, මිදිගම තුර්කි ගම්මාන කඩකාමර බදුදීම

වැලිගම ප්‍රාදේශීය ලේකම් විසින් මෙම කඩකාමර වල අයිතිය ප්‍රාදේශීය සභාව වෙත පවරා දී තිබුණි. 2006 නොවැම්බර් 25 දින මෙම සංකීර්ණයේ උඩුමහලේ කඩ කාමර 10 ක් හා පහත මාලයේ කඩ කාමර 11 ක් බදුදීම සඳහා ටෙන්ඩර් කැඳවා තිබුණි.

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) අංක 09 හා 10 දරන කඩකාමර හිමියන්ගේ එක්වන් බදු මුදල රු.100,000 බැගින් හිඟව පැවතිණි.

(ආ) මෙම කඩකාමර බිල්කර නොතිබුණ අතර බිල් නොකිරීම නිසා ඉකුත් වසර 07 ක් වෙනුවෙන් රු. 1.296,000 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි.

(ඇ) කඩ හිමියන් මෙම කඩ කාමර ලබාගත්තද ඒවායේ කඩ පවත්වාගෙන ගොස් නොතිබුණි. නමුත් මේ කඩකාමර සඳහා සභාව නමින් විදුලිය ලබාගෙන තිබූ බැවින් කඩකාමර 10 වෙනුවෙන්

රු.63,012 ක මුදලක් ලංකා විදුලි ගාස්තු ලෙස විදුලි බල මණ්ඩලයට ගෙවා තිබූ අතර තවදුරටත් රු.1,622,743 ක මුදලක් ලංකා විදුලි බල මණ්ඩලය වෙත ගෙවීමට තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
----------------------------

3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
------------------------------

(අ) 2013 වර්ෂයේදී සභාව වීථි පහන් නඩත්තුව හා අනෙකුත් වියදම් වෙනුවෙන් රු.1,687,374 ක මුදලක් වැයකර තිබූ අතර මාතර විදුලි ඉංජිනේරු මගින් රු.19,296 ක මුදලක් ප්‍රතිපූර්ණය වී තිබූ නිසා රු.1,668,078 ක වටිනාකමක් සභා අරමුදලට වැය බරක් වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා සඳහා රු.11,458,900 ක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂය තුල වැටුප් හා දීමනා ලෙස රු.12,936,597 ක මුදලක් වැයකර තිබුණෙන් සභා අරමුදලට රු.1,477,697 ක මුදලක් අතිරේක වැය බරක් වී තිබුණි.

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය
----------------------------------------

අයවැය පාලනය
------------------

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව වු ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් ඒ අනුව අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය පාලන කාරකයක් ලෙසට යොදාගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලන
------------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය